


# වඩා ස්වභාවිකව සාක්ෂිය බෙදාගන්නේ කෙසේද

*දේවසේවය යනු සාක්ෂි දැරීමයි. දේවසේවයේ ඇති නම්‍යශීලී බාවය විධිමත් සහ අවිධිමත් ලෙස සාක්ෂිය බෙදාගැනීමට අපට ඇති අවස්ථාවන් බහුල කරයි.*

“සියලු කාලයන්හිද, සියලු දේවල් තුලහිද, සියලු ස්ථානයන්හිද දෙවියන්වහන්සේට සාක්ෂියක්ව නැගී සිටීමට” අප ගිවිසගෙන ඇත (මොසායා 18:9). අපගේ සාක්ෂිය බෙදා ගැනීම සාක්ෂිකරුවෙකු ලෙස නැගී සිටීමේ කොටසක් වන අතර කෙනෙකුගේ හදවත ස්පර්ශ කර ඔවුන්ගේ ජීවතය වෙනස්කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට ආරාධනා කිරීමට ඇති බලවත් මාර්ගයක්ද වනවා.

“ආත්මයෙන් උපන් ශුද්ධාත්මයාණන් විසින් තහවුරු කරන ලද, සාක්ෂිය-සැබෑ සාක්ෂිය, ජීවිත වෙනස් කරයි” යනුවෙන් අපොස්තුලුවරු දොළොස්දෙනාගේ සනපූර්ණයේ වැඩබලන සභාපති වන සභාපති එම්. රසල් බැලර්ඩ් පවසනවා.[1]

නමුත් අප සමහරක් දෙනෙකුට අපගේ සාක්ෂිය බෙදා ගැනීම තැතිගන්වන සුළු හෝ අපහසු දෙයක් විය හැකිය. එය එසේ විය හැක්කේ සාක්ෂිය බෙදා ගැනීම පිළිබඳව අප සිතන්නේ උපවාස සහ සාක්ෂි රැස්වීමේදී හෝ පාඩමක් උගන්වන විට නිසා විය යුතුය. එවැනි විධිමත් පසුබිමක අප බොහෝ විට භාවිතා කරනු ලබන වචන සහ වාක්‍ය සාමාන්‍ය කතා කතාබහකදී නොගැලපෙන බවක් දැනේ.

එදිනෙදා කටයුතුවලදී අප විශ්වාස කරනු ලබන දේ බෙදාගැනීම කෙතරම් සරලද කියා තේරුම් ගත්විට සාක්ෂිය බෙදාගැනීම අපගේ සහ අන් අයගේ ජීවිත වල නිතිපතා ආශිර්වාදයක් විය හැකිය. ආරම්භ කිරීමට උදවු වීමට මෙන්න ඔබට අදහස් කිහිපයක්.

**එය සරලව තබන්න**

සාක්ෂියක් “මම මගේ සාක්ෂිය බෙදාගැනීමට කැමතියි” යන වැකියෙන් ආරම්භ කිරීමට සහ “යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමෙන්, ආමෙන්” යනුවෙන් අවසන් කිරීමට අවශ්‍ය වන්නේ නැත. සාක්ෂියක් අවශ්‍ය යනු අප විශ්වාස කරන දෙයක් හෝ සත්‍යයි කියා දන්නා දෙයක ප්‍රකාශනයකි. ඉතින් ඔබගේ අසල්වැසියා පාරේදී මුණගැසී ඇයට ඇති ප්‍රශ්ණයක් පිළිබඳව කතාබහ කර, “මම දන්නවා දෙවියන්වහන්සේ යාච්ඤා වලට පිළිතුරු දෙනබව,” යයි පැවසීම සභාවේ දේශනා කුඩුව මත සිට බෙදාගනු ලබන ඕනෑම සාක්ෂියක් මෙන්ම බලගතු විය හැක. බලය පැමිණෙන්නේ විසිතුරු වචන වලින් නොවේ; එය පැමිණෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් සත්‍ය තහවුරු කිරීම තුලිනි (දහම සහ ගිවිසුම 100:7-8 බලන්න).

**එදිනෙදා කතාබහේ පසුබිමට සරිලන ලෙස සකසා ගැනීම**

අපි බෙදාගැනීමට කැමතියි නම්, අප සෑම කෙනෙකු වටාම එදිනෙදා කතාබහට ගැලපෙන සාක්ෂියකට අවස්තාවන් තිබෙනවා. උදාහරණයක් ලෙස:

- කෙනෙකු ඔබගෙන් ඔබගේ සති අන්තය පිළිබඳව විමසනවා. “එය ගොඩක් හොඳයි”, ඔබ පිළිතුරු දෙනවා. “මට අවශ්‍ය වූ එකම දේ පල්ලියයි.”
- ඔබගේ ජීවිතයේ තිබෙන අභියෝගයක් පිළිබඳව දැනගැනීමෙන් පසුව කෙනෙකු “මට කනගාටුයි” කියා සංවේගය ප්‍රකාශ කෙරූ විට: ඔබ පිළිතුරු දෙනවා: “ඔබගේ සැලකිල්ලට ස්තුතියි. මම දන්නවා දෙවියන්වහන්සේ මාව බලාගන්නවා කියලා. උන්වහන්සේ මීට පෙර මා වෙනුවෙන් සිටියා”
- කෙනෙකු ප්‍රකාශ කරනවා: “මම බලාපොරොත්තු වෙනවා මේ භයානක කාලගුණය වෙනස්වෙයි කියලා,” හෝ “අනිවාර්යෙන්ම බස් එක පරක්කුයි,” හෝ “මේ වාහන තදබදය දිහා බලන්න.”

යනුවෙන්. ඔබට පිළිතුරු දිය හැකියි: "මට විශ්වාසයි දෙවියන්වහන්සේ හැමදෙයක්ම හොඳින් වෙන්න උදවු කරයි කියලා."

**ඔබගේ අත්දැකීම් බෙදා ගන්න**

අප බොහෝ විට එකිනෙකා සමඟ අපගේ අභියෝග පිළිබඳව කතාබහ කරනවා. කෙනෙකු ඔවුන් මුහුණදෙන දේවල පිළිබඳව ඔබ සමඟ පැවසූ විට, ඔබට පුළුවන් ඔබගේ පරීක්ෂාවන් වලදී දෙවියන්වහන්සේ ඔබට උදවු කල අවස්ථාවක් පිළිබඳව බෙදාගෙන දෙවියන්වහන්සේට ඔවුන්ට උදවු කල හැකි බව ඔබ දන්නා බවට සාක්ෂි දැරීමට. අපගේ පරීක්ෂාවන් වලදී උන්වහන්සේ අපව ශක්තිමත් කරන බව ස්වාමීන්වහන්සේ පැවසූ සේක, එසේ කරන්නේ "එනම් මින්පසු නුඹලා මා උදෙසා සාක්ෂියක්ව සිටීමටය, එනම් නුඹලා සත්‍යයෙන්ම මම ස්වාමි වූ දෙවියන්වහන්සේ බව දැනගැනීමටය, මම මගේ ජනතාවගේ පීඩාවේදී බැහැදකින" පිණිසය(මොසායා 24:14). අපගේ පරීක්ෂාවන් වලදී උන්වහන්සේ උදවු කර ඇත්තේ කෙසේද කියා සාක්ෂි දැරීම තුලින් අපට උන්වහන්සේගේ සාක්ෂිකරුවෙකු විදිහට නැගී සිටිය හැකියි.

**සූදානම්ව සිටින්න**

අප සමහර දෙනෙකුට, එම මොහොතෙහිම සාක්ෂිය බෙදාගැනීම තැතිගන්වන සුළු විය හැකියි. "අප තුල ඇති බලාපොරොත්තුවේ හේතුවක් ඉල්ලා සිටින සෑම මිනිසෙකුටම පිළිතුරක් දීමට සෑම විටම සූදානම්ව සිටීමට" අපට කලින් සැලසුම් කල හැකි ක්‍රම තිබේ (1 පේදුරු 3:15).

පළමුව, සූදානම්ව සිටීම යනුවෙන් අදහස්වන්නේ අප ජීවත්වන ආකාරය දෙස බැලීම විය හැකියි. අප ශුද්ධාත්මයාණන්වහන්සේ හට අපගේ ජීවිත වලට ආරාධනා කර ධර්මිෂ්ඨව ජීවත්වීම තුලින් සෑම දිනකම අපගේ සාක්ෂි ශක්තිමත් කරගනු ලබනවාද? අපට කතා කිරීමට සහ යාච්ඤාව සහ ශුද්ධලියවිලි අධ්‍යනය තුලින් අපට අවශ්‍ය වචන ලබා දීමට අප ශුද්ධාත්මයාණන් හට අවස්ථාවන් ලබාදෙනවාද? ස්වාමීන්වහන්සේ හයිරම් ස්මිත් හට උපදේශ කළාක් මෙන්, "මගේ වචනය ප්‍රකාශ කිරීමට උත්සහ නොකරන්න, නමුත් පළමුව මගේ වචනය ලබාගන්න එවිට ඔබගේ දිව ලිහිල් කරනු ඇත" (දහම සහ ගිවිසුම 11:21).

දෙවනුව, සූදානම්ව සිටීම යනුවෙන් අදහස් වන්නේ ඔබගේ සාක්ෂිය බෙදාගැනීමට එම දවසේ හෝ එම සතියේ ඔබට ලැබිය හැකි අවස්ථාවන් පිළිබඳව සලකා බැලීමයි. ඔබ විශ්වාසකරන දේවල් බෙදාගැනීමට ඔවුන් ඔබට අවස්ථාවක් ලබාදිය හැකි ආකාරය පිළිබඳව සිතීම තුලින් ඔබට එම අවස්ථාවන් සඳහා සූදානම් විය හැකියි.

**ගැලවුම්කරුවාණන් සහ උන්වහන්සේගේ දහම මධ්‍යස්තව සිටින්න.**

සභාපති බැලර්ඩ් ඉගැන්වූවා, "සභාවේ සාමාජිකයන් ලෙස බොහෝ දේවල් පිළිබඳව අපට සාක්ෂි තිබිය හැකි වුවත්, එකිනෙකාට නිතරම ඉගැන්වීමට සහ බෙදාගැනීමට අවශ්‍ය මූලික සත්‍යන් තිබෙනවා. උදාහරණයක් ලෙස, ඔහු ලැයිස්තු ගතකරනවා: "දෙවියන්වහන්සේ අපගේ පියාණන් සහ යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව. ගැලවීමේ සැලැස්ම පදනම්ව ඇත්තේ ගලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීම මතයි. ජෝසප් ස්මිත් විසින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාලික සුභාරංචිය සම්පූර්ණත්වයෙන් නැවත පිහිටුවීම සහ අපගේ සාක්ෂිය සත්‍ය බවට මෝර්මන් පොත සාක්ෂි දැරීම." අප මෙම අවංක සත්‍යන් ප්‍රකාශ කිරීමෙන්, අප කියූ දේ සත්‍ය බවට සාක්ෂි දැරීමට අප ශුද්ධාත්මයාණන් හට ආරාධනා කර සිටිමු. සභාපති බැලර්ඩ් අවධාරණය කර සිටියා "ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව පිරිසිදු සාක්ෂියක් උපන් විට ශුද්ධාත්මයාණන්වහන්සේව අවහිර කල නොහැකි බව". [2]

**ගැලවුම්කරුවාණන්ගේ ආදර්ශය**

සමාරිය හරහා ගමනකින් වෙහෙසට පත්ව, ගැලවුම්කරුවාණන්වහන්සේ මදක් විවේක ගැනීමට ළිඳක් අසල නතර වූ විට එහිදී කාන්තාවක් මුණ ගැසුනා. උන්වහන්සේ ළිඳෙන් වතුර ඇදීම පිළිබඳව කතාබහක් ආරම්භ කළා. එම කාන්තාව නිරතව සිටි දිනපතාම සිදුකරන එම කාර්යය උපයෝගී කරගැනීම මඟින්, උන්වහන්සේව විශ්වාසකරන කවරෙකුට වුවද ලබාගත හැකි සදාකාලික ජීවිතය සහ ජීවනදායක ජලය පිළිබඳව සාක්ෂි දැරීමට යේසුස්වහන්සේට අවස්තාවක් ලබාදුන්නා.

**සරල සාක්ෂියකට ජීවිත වෙනස්කල හැකියි.**

අසීරු ශල්‍යකර්ම ක්‍රියාපටිපාටියකට පසු එකල වෛද්‍ය නෙල්සන්ගෙන් ප්‍රශ්නයක් ඇසූ හෙදියක් පිළිබඳව සභාපති රසල් එම්. නෙල්සන් පවසා ඇත. "ඇයි ඔබ අනෙකුත් ශල්‍ය වෛද්‍යවරුන් මෙන් නොවන්නේ?" ඇය දැනසිටි සමහර ශල්‍ය වෛද්‍යවරුන් එවැනි ඉහල පීඩනකාරී ක්‍රියාවලියක් ඉටුකරන විට ඉක්මනින් කිපෙන සුළු සහ දේවාපහාසකාරී වූවා වියහැක.

වෛද්‍ය නෙල්සන් හට ඕනෑම ආකාරයකට මෙයට පිළිතුරු දියහැකිව තිබුණි. නමුත් ඔහු "මොකද මම දන්නවා මෝර්මන් පොත සත්‍යයි කියලා" යනුවෙන් සරලව පිළිතුරු දුන්නා.

ඔහුගේ පිළිතුර හෙදිය සහ ඇයගේ ස්වාමිපුරුෂයා හට මෝර්මන් පොත අධ්‍යනය කිරීමට පෙළඹවූවා. පසුකලෙක සභාපති නෙල්සන් හෙදියව බෞතීස්ම කළා. දශක කිහිපයකට පසු, අලුතින් නියම කල අපොස්තුළුවරයෙකු ලෙස USA ටෙන්නෙසී හි ස්ටේක සම්මන්ත්‍රණයක මූලාසනය උසුලන විට, සභාපති නෙල්සන් හට එම හෙදිය සමඟ අනපේක්ෂිත නැවත හමුවක් බුක්තිවිඳීමට හැකිවූවා. ඔහුගේ සරල සාක්ෂිය සහ මෝර්මන් පොතේ බලපෑම ගෙන ආ ඇයගේ හැරී ඒම, තවත් 80 දෙනෙකුගේ හැරී ඒමට මඟ පෑදූ ආකාරය ඇය විස්තර කළා. [3]

**ක්‍රියාකිරීමට ආරාධනය**

ඔබගේ සාක්ෂිය බෙදාගැනීමට බිය නොවන්න. ඔබ දේවසේවයේ යෙදෙන අය ආශිර්වාද කිරීමට එයට හැකියාව ඇත. අද ඔබගේ සාක්ෂිය බෙදා ගැනීමට මෙම අදහස් හෝ ඔබගේම අදහසක් උපයෝගී කරගන්නේ කෙසේද?

"දේවසේවා මූලධර්ම" ලිපි වල අරමුණ වන්නේ එකිනෙකා වෙනුවෙන් සැලකිලිමත් වීමට ඉගෙනගැනීමට අපට උදවු වීමයි - බැහැදැකීම් වලදී පණිවිඩයක් ලෙස බෙදා ගැනීම නොවේ. අප සේවය කරන අය හඳුනාගත් පසු, අපගේ සැලකිල්ල සහ සානුකම්පාවට අමතරව ඔවුන්ට අවශ්‍ය වන පණිවිඩය කුමක්දැයි ශුද්ධාත්මයාණන්වහන්සේ අපට සිහිකරනවා ඇත.

**ඔබගේ අත්දැකීම් බෙදාගන්න.**

ඔබට දේවසේවය ලැබුණු විට සහ ඔබ අන්අයට දේවසේවය කරන විට ලැබෙන අත්දැකීම් අපට එවන්න. liahona.lds.org වෙත ගොස් "Submit an Article or Feedback" මත ඔබන්න.

**සටහන්**


1.M. Russell Ballard, “Pure Testimony,” *Liahona*, Nov. 2004, 40.
2.M. Russell Ballard, “Pure Testimony,” 41.
3.In Jason Swensen, “Be Ready to Explain Your Testimony Using the Book of Mormon, President Nelson Says,” Church News section of LDS.org, Feb. 6, 2018, news.lds.org.



© 2019 by Intellectual Reserve, Inc. සියලුම හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි. ඉංග්‍රීසි අනුමැතිය: 6/18. පරිවර්තන අනුමැතිය: 6/18. *Ministering Principles, March 2019* හි පරිවර්තනයකි. Sinhala. 15764 408